

# ඕවාද ප්‍රාතිමෝක්ෂය

# ඕවාදප්‍රාතිමොක්ෂය.

අටුවාව සහිත පුරාණසන්න යෙන්ද
අභිනව කරණ ලද
විසිතුරු භාවසන්න යෙන්ද
උපලක්ෂිතයි.

උගත් සාමින් වහන්සේ නමක් විසින්
සකස් කරණලදී.

මාද්දුවේ.
ඩී. බී. ජයතිලක වෛද්‍යාචාර්ය්‍ය තැනැද්.
සොරණ.
ඩී. ජී. ගජ්‍රා වෛද්‍යාචාර්ය්‍ය. පු. ස. ජ.
හල්තොට. බෞද්ධ පාඨශාලා දෙකක් මැනේජර්
යන අයවිසින්

කළුතරේ
සුබපිගොදය අච්චු සන්තාලයෙහි
මුද්‍රණය කරවන ලදී.

පොතක මිළ ශත 16

ශ්‍රී: බු. ව. 2440.
ක්‍රි. ව. 1897.

# ඔවාද පාතිමොක්ඛං.

නමො තස්ස
භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

“සබ්බපාපස්ස අකරණං”ති ඉමං ධම්මදෙසනං සත්ථා ජෙතවනෙ විහරන්තො ආනන්දත්ථෙරස්ස පඤ්හං ආරබ්භ කථෙසි. ථෙරො කිර දිවාට්ඨානෙ නිසින්නො චින්තෙසි.—

සත්ථාරා “සත්තන්නං බුද්ධානං මාතාපිතරො ආයුපරිච්ඡෙදො බොධි සාවක සන්නිපාතො අග්ගසාවකා උපට්ඨාකො”ති සබ්බං කථිතං උපොසථො පන අකථිතො. කිං නු ඛො තෙසම්පි අයමෙව උපොසථො අඤ්ඤො”ති සො සත්ථාරං උපසංකමිත්වා තමත්ථං පුච්ඡි. යස්මා පන තෙසං බුද්ධානං කාලභෙදොව අහොසි න ගාථා භෙදො. විපස්සීසම්මාසම්බුද්ධො හි සත්තමෙ සත්තමෙ සංවච්ඡරෙ උපොසථං අකාසි. ඒකදිවසං දින්නොවාදොයෙව හිස්ස සත්තන්නං සංවච්ඡරානං අලං හොති. සිඛී ච වෙස්සභූ ච ඡට්ඨෙ ඡට්ඨෙ සංවච්ඡරෙ උපොසථං කරිංසු. කකුසන්ධො ච කොණාගමනො ච සංවච්ඡරෙ සංවච්ඡරෙ උපොසථං කරිංසු. කස්සපදසබලො ඡට්ඨෙ ඡට්ඨෙ මාසෙ උපොසථංඅකාසි. ඒකදිවසං දින්නොවාදොයෙව ඡන්නං මාසානං අලං හොති. තස්මා සත්ථා තෙසං ඉමං කාලභෙදං ආරොචෙත්වා ඔවාදගාථා පන තෙසං ඉමායෙවාති වත්වා සබ්බෙසං ඒකමෙව උපොසථං ආවිකරොන්තො ඉමා ගාථා අභාසි.

1 “සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා
සචිත්තපරියොදපනං ඒතං බුද්ධානසාසනං.
2 ඛන්තීපරමං තපො තිතික්ඛා නිබ්බාණං පරමං වදන්ති බුද්ධා
නහි පබ්බජිතොපරූපඝාතී සමණොහොතිපරංවිහෙඨයන්තො
3 අනූපවාදො අනූපඝාතො පාතිමොක්ඛෙ ච සංවරො.
මත්තඤ්ඤුතා ච භත්තස්මිං පන්තඤ්ච සයනාසනං
අධිචිත්තෙ ච ආයොගො ඒතං බුද්ධානසාසනං”ති.

තත්ථ “සබ්බපාපස්සාති” සබ්බස්ස අකුසලකම්මස්ස “අකරණංති” අනුප්පාදනං. “කුසලස්ස උපසම්පදා”ති අභිනික්ඛමනතො පට්ඨාය යාව අරහත්තමග්ගා කුසලස්ස උප්පාදනඤ්චෙව උප්පාදිතස්ස ච භාවනා

"සචිත්තපරියොදපනං" ති පඤ්චහි නිවරණෙහි අත්තනො චිත්තස්ස වොදාපනං "එතං බුද්ධානසාසනං"ති සබ්බබුද්ධානං අය මනුසිට්ඨි—"ඛන්ති"ති යා එසා තිතික්ඛාසඞ්ඛාතා ඛන්ති නාම ඉදං ඉමස්මිං සාසනෙ පරමං උත්තමං තපො "නිබ්බාණං පරමං වදන්ති බුද්ධා" ති බුද්ධා ච පච්චෙකබුද්ධා ච අනුබුද්ධාචාති ඉමෙ තයො බුද්ධා නිබ්බාණං උත්තමං වදන්ති.

"නහිපබ්බජිතො"ති පාණිආදීහි පරං උපහනන්තො විහෙඨෙන්තො පරූපඝාති පබ්බජිතො නාම නහොති. "සමණො"ති වුත්තනයෙනෙව පරං විහෙඨයන්තො සමණොපි න හොතියෙව

"අනූපවාදො" ති අනූපවාදනඤ්චෙව අනුපවාදාපනඤ්ච "අනූපඝාතො" ති අනූපහනනඤ්චෙව අනූපඝාතාපනඤ්ච. "පාතිමොක්ඛෙ"ති ජෙට්ඨකසීලෙ. "සංවරො" ති පිදහනං. "මත්තඤ්ඤුතා"ති මත්තඤ්ඤුභාවො පමාණජානනං "පන්තං"ති විවිත්තං. "අධිචිත්තෙ"ති අට්ඨසමාපත්තිසඞ්ඛාතෙ අධිකචිත්තෙ. "ආයොගො" ති පයොගකරණං. "එතං"ති එතං සබ්බම්පි බුද්ධානං සාසනං—

එත්ථ හි "අනූපවාදෙන" වාචසිකසීලං කථිතං "අනූපඝාතෙන" කායිකසීලං. "පාතිමොක්ඛෙ ච සංවරො"ති ඉමිනා පාතිමොක්ඛසීලඤ්චෙව ඉන්ද්‍රියසංවරඤ්ච. "මත්තඤ්ඤුතාය" ආජීවපාරිසුද්ධි ච පච්චයසන්නිස්සිතසීලඤ්ච. "පන්තසෙනාසනෙන" සප්පායසෙනාසනං. "අධිචිත්තෙන "අට්ඨසමාපත්තියො. එවං ඉමාය ගාථාය තිස්සොපි සික්ඛා කථිතා එව හොන්ති.

දෙසනාවසානෙ බහු සොතාපත්තිඵලාදීනි පාපුණිංසූති.

ධම්මපදට්ඨකථාය

ආනන්දත්ථෙරස්ස වත්ථු.

## ඔවාද ප්‍රාතිමොක්‍ෂ සන්නය.

නමො තස්ස භගවතො
අරහතො සම්මා සම්බුද්ධස්ස.

ශ්‍රීඝන සුගත තථාගතවූ අපසම්‍යක්සම්බුද්ධසර්වඥ රාජොත්තමයාණන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ ජෙතවනමහවිහාරයෙහි වැඩවාසයකරවදාරණසේක්. ආයුෂ්මත්වූ ආනන්‍දස්ථවිරයන්වහන්සේගේ ප්‍රශනයක් අරබයා මේ ඔවාද ප්‍රාතිමොක්‍ෂය දෙසනා කරවදාළසේක.

ඒකෙසේදයත්?.

මේ මහා භද්‍රකල්පයට අනූ එක්වෙනි කල්පයෙහි ක්‍ෂත්‍රිය රාජවංසයෙහි කොණ්ඩඤ්ඤ ගොත්‍රොද්භූතවූ අටාසූරියන්උස බුදුබඳින්යුක්තවූ විපස්සිනම්බුදුරජාණන්වහන්සේට බන්‍ධුමතීනම්නුවර රාජ්‍ය කරන්නාවූ බන්‍ධුමතීනම් රජෙක් පිතෘවූයේය. බන්‍ධුමතීනම් දේවිය මාතෘවිය අසූදහසක් අවුරුදු ආයුෂ ප්‍රමාණය වූයේය. බොධිය පලෙල් වෘක්‍ෂය වූයේය අටසැට ලක්‍ෂයක් රහතුන්වහන්සේගෙන් පළමුවෙනි ශ්‍රාවක සන්නිපාතයද අසූලක්‍ෂයක් රහතුන්වහන්සේගෙන් දෙවෙනි ශ්‍රාවකසන්නිපාතයද අසූදහසක් රහතුන් වහන්සේගෙන් තුන්වෙනි ශ්‍රාවකසන්නිපාතයදැයි මෙසේ ශ්‍රාවකසන්නිපාත තුනක් වූවාහුය ඛණ්ඩය තිස්සය යන අග්‍රශ්‍රාවක දෙනමක් වූවාහුය අසොකනම් තෙරුන්වහන්සේ කෙනෙක් උපස්ථායක වූයේය.

මෙසින් තිස්එක්වෙනි කල්පයෙහි ක්‍ෂත්‍රිය රාජවංසයෙහි කොණ්ඩඤ්ඤ ගොත්‍රොද්භූතවූ සැත්තෑ රියන් උස බුදුබඳින් යුක්තවූ සිඛී නම් බුදු රජාණන් වහන්සේට අරුණවතීනම් නුවර රාජ්‍ය කරන්නාවූ අරුණනම් රජකෙනෙක් පිතෘවූයේය. ප්‍රභාවතීනම් දේවිකෙනෙක් මාතෘ විය සැත්තෑදහසක් අවුරුදු ආයුෂ ප්‍රමාණය වූයේය. බොධිය ඇටඹ ගස වූයේය. ලක්‍ෂයක් රහතුන්වහන්සේගෙන් පළමුවෙනි ශ්‍රාවක සන්නිපාතයද අසූදහසක් රහතුන් වහන්සේගෙන් දෙවෙනි ශ්‍රාවක සන්නිපාතයද සැත්තෑදහසක් රහතුන් වහන්සේගෙන් තුන්වෙනි ශ්‍රාවක සන්නිපාතයදැයි මෙසේ ශ්‍රාවක සන්නිපාත තුනක් වූවාහුය. අභිභූය සම්භවය යන අග්‍රශ්‍රාවක දෙනමක් වූවාහුය. ඛෙමඞ්කරනම් තෙරුන් වහන්සේ කෙනෙක් උපස්ථායක වූයේය.

ඒ තිස්එක් වෙනි කල්ප යෙහිම ක්‍ෂත්‍රිය රාජ වංසයෙහි
කොණ්ඩඤ්ඤ ගොත්‍රොද්භූතවූ සැට රියන් උස බුදුබඳක් ඇත්තාවූ
වෙස්සභූ නම් බුදුරජාණන්වහන්සේට අනොපමනම්නුවර රාජ්‍ය
කරන්නාවූ සුප්පතීත නම් රජකෙණෙනක් පිතෘ වූයේය. යසවතී
නම් දේවීකෙනෙක් මාතෘවිය සැට දහසක් අවුරුදු ආයුෂ ප්‍රමා
ණය වූයේය. බොධිය සාලවෘක්‍ෂය වූයේය. අසූදහසක් රහතුන්
වහන්සේගෙන් පළමුවෙනිශ්‍රාවකසන්නිපාතයද සැත්තෑදහසක්
රහතුන් වහන්සේගෙන්දෙවෙනි ශ්‍රාවකසන්නිපාතයද සැටදහ
සක් රහතුන් වහන්සේගෙන්තුන්වෙනි ශ්‍රාවකසන්නිපාතයදැයි
මෙසේ ශ්‍රාවක සන්නිපාත තුනක් වූවාහුය. සොනය උත්තරය
යන අග්‍රශ්‍රාවක දෙනමක් වූවාහුය. උපසන්තක නම් මහතෙරුන්
වහන්සේකෙනෙක් උපස්ථායකවූයේය.—මේ මහා භද්‍රකල්ප යෙහි
ඛෙමවතීනම් නුවර ඛෙමනම් රජ්ජුරු කෙනෙක් රාජ්‍ය කරණ
කල්හි බ්‍රාමහණ වංසයෙහි කාශ්‍යප ගොත්‍රොද්භූතවූ සතලිස්
රියන් උස බුදුබඳින් බබලන්නාවූ පලමුවෙනි කකුසඳනම් බුදු
රජාණන්වහන්සේට අග්ගිදත්තනම් බ්‍රාහමණෙකෙනෙක්පිතෘවූයේය
විසාඛානම් බැමිණි කෙනෙක් මාතෘ විය සතලිස් දහසක් අවුරුදු
ආයුෂ ප්‍රමාණය වූයේය බොධිය මහරි වෘක්‍ෂය වූයේය සතලිස් දහ
සක් රහතුන්වහන්සේගෙන් යුක්තවූඑකම ශ්‍රාවකසන්නිපාතයෙක්
වූයේය. විධුරය සඤ්ජීවය යන අග්‍රශ්‍රාවක දෙනමක් වූවාහුය භු
ම්ඣිජ නම් තෙරුන්වහන්සේ කෙනෙක් උපස්ථායකවූයේය.

මේ කල්පයෙහිම සොභවතී නම් නුවර සොභනනම් රජ්ජුරු
කෙනෙක් රාජ්‍ය කරණකල්හි බ්‍රාහමණ වංසයෙහි කාශ්‍යප
ගොත්‍රාද්භූතවූ තිස්රියන් උස බුඕශරීරයෙන් බබලන්නාවූ දෙවෙනි
කොණාගමණ නම් බුදු රජාණන්වහයසේට යඤ්ඤදත්තනම්බමුණු
කෙනෙක් පියවූයේය උත්තරානම් බැමිණිකෙනෙක් මව් විය තිස්
දහසක් අවුරුදු ආයුෂ ප්‍රමාණය වූයේය බොධිය දිඹුල් වෘක්‍ෂය වූ
යේය තිස්දහසක් රහතුන් වහන්සේගෙන් යුක්තවූ එකම ශ්‍රාවක
සන්නිපාතයක් වූයේය. භීයොසය උත්තරය යන අග්‍රශ්‍රාවක දෙන
මක් වූවාහුය. සොත්ථිජ නම් තෙරුන්වහන්සේ කෙනෙක් උප
ස්ථායක වූයේය.

මේ කල්පයෙහි බරනැස්නුවර කිකී නම්කසී රජ්ජුරුකෙනෙක්
රාජ්‍ය කරණ කල්හි බ්‍රාහමණ වංසයෙහි කාශ්‍යප ගොත්‍රොද්භූතවූ
විසිරියන් උස බුදුබඳින් විරාජමානවූ තුන්වෙනි කාශ්‍යපනම් බුදු
රජාණන්වහනසේට බ්‍රහමදත්ත නම් බ්‍රාහමණ කෙනෙක් පිතෘවූයේය

ධනවතී නම් බැමිණී කෙනෙක් මාතෘවිය විසිදහසක් අවුරුදුආයුෂ ප්‍රමාණය වූයේය. බොධිය නුගවෘක්ෂය වූයේය. විසිදහසක් රහතුන්වහන්සේගෙන්යුක්තවූ එකම ශ්‍රාවකසන්නිපාතයෙක්වූයේ ය. තිස්සය භාරද්වාජය යන අග්‍රශ්‍රාවක දෙනමක් වූවාහුය. සබ්බමිත්ත නම් තෙරුන්වහන්සේ කෙනෙක් උපස්ථායක වූයේය.

මේ කල්පයෙහිම ක්ෂත්‍රිය රාජවංශයෙහි ගෞතම ගොත්‍රොද්භූතවූ අටලොස්රියන් උස බුදුබඳින් ශොභමානවූ අප ගෞතම නම් බුදුරජාණන් වහන්සේට කිඹුල්වත්පුර නුවර රාජ්‍යය කරන්නාවූ සුඬොදන නම් මහරජතෙමේ පිතෘවූයේය මායානම්වූ අග්‍රමහෙසිකා තොමෝ මාතෘවිය ආයුෂය සියක් අවුරුදු ප්‍රමාණ කාලය වූයේය බෝධිය ඇසතුවෘක්ෂයවූයේය එක්දහස්දෙසියපනසක් රහතුන් වහන්සේගෙන් යුක්තවූ එකම ශ්‍රාවකසන්නිපාතයක් වූයේය ශාරිපුත්‍රය මෞද්ගල්‍යායනය යන අගසව් දෙනමක් වූවාහුය ආනන්‍දනම් ස්ථවිරකෙනෙක් උපස්ථායක වූයේයයි මෙසේ අප ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ විසින් විපස්සි අදි සත්බුදුවරයන් වහන්සේලාගේ මව්පියෝද ආයුෂ ප්‍රමාණයද බොධියද ශ්‍රාවක සන්නිපාතයද අග්‍රශ්‍රාවකයෝද උපස්ථායකතෙමේදැයි යනාමේ සියල්ල වදාරණලද්දේය පොහෝකිරීම මනාහී නොවදාරණ ලද්දේය කිමෙක්ද ඒ විපස්සී ආදී බුදුවරයන් වහන්සේලාගේත් මේ පොහෝ කිරීමමවේද අනික් පොහෝ කිරීමෙක් වේදැයි දිවාස්ථානයෙහි වැඩලන්නාවූ අනන්‍දස්ථවිරයන් වහන්සේ සිතාවදාරා හුනස්නෙන් නැගිට ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි එළඹ බුදුන් වැඳ එකත්පස්ව හිඳ ස්වාමිනි භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්ස තුබවහන්සේ විසින් විපස්සී ආදිසත් බුදුවරයන්ගේ මව්පියෝද ආයුෂ ප්‍රමාණයද බොධියද ශ්‍රාවකසන්නිපාතයද අග්‍රශ්‍රාවකයෝද උපස්ථායකතෙමේද යන මේ සියල්ල වදාරණලද්දේය පොහෝකිරීම නොවදාරණලද්දේය කිමෙක්ද ඒ විපස්සී ආදිබුදුවරයන්ගේත් මේ පොහෝ කිරීමම වේද අනික් පොහෝ කිරීමෙක් වේදැයි විචාළේය.

යම් හෙයකින් වනාහී ඒ බුදුවරයන්ගේ කාලයාගේම වෙනස වූයේද ගාථාවන්ගේ වෙනසක් නොවූයේද එහෙයින් විපස්සී බුදුරජාණන් වහන්සේ සත්සත්වෙනි අවුරුද්දෙහි පොහෝකෙළේය එසමයෙහි වනාහී ජම්බුද්වීපයෙහි සුවාසූදහසක් ආවාස වූවාහුය ඒ සියළු ආවාසයෝ දසදහසක් විසිදහසක් භික්ෂූන් ගන්නා මහාවිහාරයෝ වෙත් ලංකාවෙහි අභයගිරිවිහාරය සෑගිරිවිහාරය

සිතුල්පව්විහාරය යන මේ මහවිහාර සමානවූවාහුය එක් අවුරුද්දක් ගියකල්හි දෙවතාවෝ නිදුකාණෙනි එක් අවුරුද්දක් ගියේය දැන් පස්අවුරුද්දක් ඉතිරි වූවාහුය පස්අවුරුද්දක්හුගේ ඇවෑමෙන් පාමොක් උදෙසීමපිණිස බන්‍ධුමතී රාජධානියට යායුතුයයි ආරොචනය කලාහුය දෑවුරුද්දක් ගියකල්හි දෙවතාවෝ නිදුකාණෙනි දෑවුරුද්දක් ගියාහුය දැන් සතර අවුරුද්දක් ඉතිරිවූවාහුය සතර අවුරුද්දක්හුගේ ඇවෑමෙන් පාමොක්උදෙසීමපිණිස බන්‍ධුමතීරාජධානියට යා යුතුයයි ආරොචනය කලාහුය. තුන් අවුරුද්දක්ගියකල්හි දෙවතාවෝ නිදුකාණෙනි තුන් අවුරුද්දක් ගියාහුය දැන් තුන් අවුරුද්දක් ඉතිරිවූවාහුය තුන් අවුරුද්දක්හුගේ ඇවෑමෙන් පාමොක් උදෙසීමපිණිස බන්‍ධුමතීරාජධානියට යායුතුයයි ආරොචනය කලාහුය සතර අවුරුද්දක් ගියකල්හි දෙවතාවෝ නිදුකාණෙනි සතර අවුරුද්දක් ගියාහුය දැන්දෑවුරුද්දක් ඉතිරිවූවාහුය දෑවුරුද්දක්හුගේ ඇවෑමෙන් පාමොක් උදෙසීමපිණිස බන්‍ධුමතීරාජධානියට යායුතුයයි ආරොචනය කලාහුය පස් අවුරුද්දක්ගියකල්හි දෙවතාවෝ නිදුකාණෙනි පස් අවුරුද්දක් ගියාහුය දැන් එක්අවුරුද්දක් ඉතිරිවූයේය එක් අවුරුද්දක්හුගේ ඇවෑමෙන් පාමොක් උදෙසීමපිණිස බන්‍ධුමතී රාජධානියට යායුතුයයි ආරොචනය කලාහුය. සාවුරුද්දක්ගියකල්හි දෙවතාවෝ නිදුකාණෙනි සාවුරුද්දක්ගියාහුය දැන්පාමොක්උදෙසීමපිණිස බන්‍ධුමතීරාජධානියට පැමිනෙන්ට කල් වන්නේයයි ආරොචනය කලාහුය

ඉක්බිත්තෙන් ඒ භික්‍ෂූන් වහන්සේලා සමහර කෙනෙක් ස්වකීය ඍද්ධි ආනුභාව යෙන්ද සමහරකෙනෙක් දෙවියන්ගේ ඍද්ධි ආනුභාව යෙනද පාමොක් උදෙසීමපිනිස බන්‍ධුමති රාජධානියට පැමිණියාහුය එහිවනාහි විපස්සි බුදුරජාණන්වහන්සේ භික්‍ෂුසංඝයාහට මේ ඔවාද ප්‍රාතිමෝක්‍ෂය දේශනාකර වදාලේය. එක්දවසෙක්හි දුන්නාවූ අවවාදයම සත් අවුරුද්දකට සෑහෙන්නේය.—සිඛීනම් බුදුරජාණන් වහන්සේද වෙස්සභූනම් බුදුරජාණන් වහන්සේද සවෙනි සවෙනි අවුරුද්දෙහි පොහෝකලාහුය. එක් දවසෙක්හි දුන්නාවූ අවවාදයම සයාවුරුද්දකට සෑහෙන්නේය කකුසඳනම්බුදුරජාණන් වහන්සේද කොණාගමණනම් බුදුරජාණන් වහන්සේද අවුරුද්දෙක්හි අවුරුද්දෙක්හි පොහෝ කලාහුය. එක්දවසෙක්හි දුන්නාවූ අවවාදයම අවුරුද්දකට සෑහෙන්නේය. කාශ්‍යපනම් බුදුරජානන් වහන්සේ සවෙනි සවෙනි මාසයෙහි පොහෝ

කෙලේය. එක්දවසෙක්හි දුන්නාවූ අවවාදයම ෂව් මාසයකට සෑහෙන්නේය. එසේ හෙයින් ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ විපස්සී ආදීසත් බුදුවරයන්ගේ මේ කාලභේදය වදාරා ඒ බුදුවරයන්ගේ අවවාද ගාථාවෝ විනාහි මේ ගාථාවෝමයයි වදාරා සියළු බුදුවරයන්ගේ එකම පොහෝකිරිම ප්‍රකාශ කරණසේක් මේ ඔවාද ප්‍රාතිමෝක්‍ෂ නම්වූ ගාථාවන් වදාළසේක.

1 සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා,
සචිත්තපරියොදපණං එතංබුද්ධානසාසනං.
2 ඛන්තිපරමං තපොතිතික්ඛා නිබ්බාණං පරමංවදන්තිබුද්ධා
නහිපබ්බජිතෙනපරූපඝාතීසමණෙහොතිපරංවිහෙඨයන්තො
3 අනූපවාදො අනූපඝාතො පාතිමොක්ඛෙ ච සංවරෝ
මත්තඤ්ඤුතා ච භත්තස්මිං පන්තඤ්ච සයනාසනං
අධිචිත්තෙ ච ආයොගොඑතං බුද්ධානසාසනන්ති.

1 සබ්බපාපස්ස අකරණං, (කායාදිවාරත්‍රයෙන් සිඬවන්නාවූ ප්‍රාණ (වධාදිවූ) සියළුඅකුසල කර්‍මයාගේ නොකිරීමද; කුසලස්ස උපසම්පදා, ගේ හැර මහණවූ තැන් පටන් රහත්ඵලයට පැමිණෙන තැන් දක්වා සියළු ලෞකික ලොකෝත්තර ) කුසලයාගේ ඉපදවීමද උපදවනලද කුසලයාගේ වැඩීමද; සචිත්තපරියොදපනං, ( පඤ්චනීවරන යන් කෙරෙන් ) තමාගේ සිත පිරිසිදු කිරීමද යන; එතං මේ සියල්ල; බුද්ධානං, සියළු බුදුවරයන්ගේ; සාසනං, අනුසාසනායි 2 තිතික්ඛා ඛන්ති, ( පරාපකාර පරාපවාද ඉවසීමය යන මේ ) අධිවාසන ක්‍ෂාන්තියක් ඇද්ද ඕ තොමෙ; පරමං තපො ( ශීලාදි ගුණ ධර්‍ම යන්ට ප්‍රතිපක්‍ෂවූ අකුසලධර්‍මයන් තවනහෙයින් මේ ශාසන යෙහි උත්තමවූ තපසෙක; බුද්ධා; සියලු බුද්ධප්‍රත්‍යෙකබුද්ධ අනුබුද්ධයෝ නිබ්බානං, ශාන්තිලක්‍ෂණ නිර්‍වාණය; පරමං වදන්ති ශාන්තප්‍රණී තාදි සර්‍වාකාරයෙන් උත්තමයයි කියති; පරූපඝාතී, පරහට හිංසා කරණ සුලුවූයේද (හෙවත් අනුන්දිවිනසනසුලුවූයේ; පබ්බජිතො නහොති, පබ්බාජයත්තනො මලං තස්මා පබ්බජිතොති, වුච්චති, යන ප්‍රව්‍රජිත ලක්‍ෂණ නැතිහෙයින් පැවිදිනම්නොවෙයි; පරං විහෙඨයන්තො පාණිප්‍රහාරාදියෙන් පරහට වෙහෙස දෙන්නේද; සමණො නහොති,("සමිතත්තාහි පාපානං සමණොති පවුච්චති යන ශ්‍රමණ ලක්‍ෂණ නැතිහෙයින් මහණනම් නොවන්නේයි.
3 අනූපවාදො, ( ජනාදීන් පරහට ආක්‍රොශාදි වශයෙන් ) වචසින් උපවාදයක් නොකිරීමද; අනූපඝාතො, ( පානිප්‍රහාරාදි වශයෙන්

පරහට කයින් ) උපඝාතයක් නොකිරීමද; පාතිමොක්ඛෙ, ප්‍රාතිමොක්ෂසංවරශීලයෙහි; සංවරොච, සංවරයද හෙවත් රක්ෂාවද; භත්තස්මිං, ආහාරයෙහි; මත්තඤ්ඤුතාව, මාත්‍රඥබවද; හෙවත් අහරපිරියෙස්මෙහිද පිළිගැන්මෙහිද වැලඳීමෙහිද පරහට දීමෙහිද පමණ දන්නාබවද නොහොත් දැහැමින් සෙමින් උපන් සතරප සය පස්විකා වලඳණ බවද; පන්තඤ්ච සයනාසනං ජන විවික්තවූ ප්‍රාන්තසයනාසනයෙහි අභිරතියද හෙවත් ගමටදුරුවල්වූ සෙනසුනෙහි ඇල්මද, අධිචිත්තෙ ච, රූපාරූප අෂ්ටසමාපත්තියෙහිද; ආයොගො ච, සතතයෙන් යෙදීමද යන, එතං මේසියල්ල; බුද්ධානං, සියලු බුදුවරයන්ගේ ශාසනං, අනුශාසනායි අවවාදයි. *B*

මෙහි අභිප්‍රාය සංක්ෂෙපයෙන් ගෙනහැර දක්වනුලැබේ. රොගයන්ගේ ඉපදීමට රොගනිදානයමෙන් අකුසලයන්ගේ ඉපදීමටද අකුසලනිදානයෝ ඇත්තාහුය. ඒ කෙසේදයත්? සියලුම අකුසලයන්ගේ ඉපදීමට නිදානතුනක් වෙත් එනම්. ලොභය අකුසල නිදානයක්වන්නේය. ද්වේෂය අකුසල නිදානයක්වන්නේය. මොහය අකුසල නිදානයක්වන්නේය සිතෙහි යම්ලොභයක්වේද එයද අකුසල්වන්නේය ලොභයෙන් යුක්තව කයින් වචසින් මනසින් යමක් රැස්කෙරේද එයද අකුසල්වන්නේය. සිතෙහි යම් ද්වේෂයෙක්වේද එයද අකුසල්වන්නේය ද්වේෂයෙන් යුක්තව කයින් වචසින් මනසින් යමක් රැස්කෙරේද එයද අකුසල්වන්නේය. සිතෙහි යම් මොහයක්වේද එයද අකුසල්වන්නේය මොහයෙන්යුක්තව කයින් වචසින් මනසින් යමක් රැස්කෙරේද එයද අකුසල්වන්නේය. මේඅකුසලනිදානතුන නම් වන්නාහුය ලොභය ද්වේෂය මොහය යනමේ අකුසල නිදානතුනින් සියලුම අකුසල් පහළ වෙත්. එසේහෙයින් සියලුම අකුසල් පහළවීමට මුල්හෙතුවන්නාවූ ලොභමොහදෙක සමගහෝ ද්වේෂමොහදෙක සමගහෝ තනිවූ මොහය සමගහෝ යෙදුනාවූ චෙතනාව පාපයනම් වන්නේය ඒ පාපය වනාහි කායදුශ්චරිතය වචීදුශ්චරිතය මනොදුශ්චරිතයයි තුන්වැදෑරුම්වේ ඒ ත්‍රිවිධ දුශ්චරිතයෝ ප්‍රාණඝාතය අදත්තාදානය කාමමිථ්‍යාචාරය මුසාවාදය කේලාම් කීමය පරුෂවචනකීමය සම්ප්‍රලාප කීමය අභිධ්‍යාය ව්‍යාපාදය මිථ්‍යාදෘෂ්ටිය කියා අකුශල කර්මපථයෝ දශදෙනෙක් වන්නාහුය එහි ප්‍රාණඝාතය අදත්තාදානය කාමමිථ්‍යාචාරය යනමොහු කායමාර්ගයෙහි බහුලව පවත්නාහෙයින් කායදුශ්චරිතයෝනම් වෙත් බොරුකීමය කේලාම් කීමය පරුෂවචන කීමය සම්ප්‍රලාප කීමය යනමොහු වාග්

---

*B* යනු පුරාතන සන්නයි

මාරයෙහි බහුලව පවත්නාබැවින් වචීදුශ්චරිතයෝනම් වෙත් අභිධ්‍යාවය ව්‍යාපාදය මිථ්‍යාදෘෂ්ටිය යනමොහු මනොද්වාරයෙහි බහුලව පවත්නා බැවින් මනොදුශ්චරිතයෝනම් වෙත් මේදශ අකුසල කර්මපථයෝම චෙතනාකර්මය චෛතසිකකර්මයයි කර්මයෝ දෙදෙනෙක් වන්නාහුය මෙහිද ද්වෙෂ මොහ වසයෙන් ද්විමූලිකව සිද්ධවන්නාවූ ප්‍රාණඝාතයද ද්වෙෂ මොහ වශයෙන් හෝ ලොභ මොහ වශයෙන්හෝ ද්විමූලිකව සිද්ධවන්නාවූ අදත්තාදානයද ලොභ මොහ වසයෙන් ද්විමූලිකව සිද්ධ වන්නාවූ කාමමිථ්‍යාචාරයද ද්වෙෂ මොහ වසයෙන් හෝ ලොභ මොහ වසයෙන් හෝ ද්විමූලිකව සිද්ධවන්නාවූ මුසාවාදය කේලාම් කීමය සම්ඵප්‍රලාප කීමය යනමොහුද ද්වෙෂ මොහ වසයෙන් ද්විමූලිකව පරුෂ වචන කීමද යනමේසත චෙතනාකර්මය නම්වූ මොහ වසයෙන් එකමූලිකව සිද්ධ වන්නාවූ අභිධ්‍යා ව්‍යාපාද දෙකද ලොභ මොහවසයෙන් ද්විමූලිකව සිද්ධ වන්නාවූ මිථ්‍යාදෘෂ්ටියද යන මේ අකුසල්තුන චෛතසික කර්මයනම්වේ මෙසේ දක්වනලද්දාවූ අකුසල්හා සම්‍යක් දෘෂ්ටියෙන් පහවූ මිථ්‍යාදෘෂ්ටිය හෙවත් දෙනලද දානයාගේ ඵලවිපාක නැත කරනලද මහත්වූ පූජාවගේ ඵලවිපාක නැත වෙහෙරට ගෙනගොස් කරණලද සත්කාරයාගේ ඵලවිපාක නැත කුශලාකුශල කර්මයන්ගේ ඵලවිපාක නැත පරලොව සිටියාහට මෙලොව නැත මෙලොව සිටියාහට පරලොව නැත මෑනියන්ට කරනලද සත්කාරයෙහි ඵලවිපාක නැත පියාණන්ට කරනලද සත්කාරයෙහි ඵලවිපාක නැත චුතව උපදින්නාවූ සත්වකෙනෙක්නම් නැත සියල්ල දත්තාවූ බුදුවරයෝනම් නැත යන මේ දශවස්තුකවූ මිථ්‍යාදෘෂ්ටියද. මිථ්‍යාසංකල්පණාව හෙවත් නෛෂ්ක්‍රම්‍යසංකල්පණාවෙන් තොරවූ පඤ්චකාමය සෙවනෙකරමියි කල්පණාකිරීම අව්‍යාපාද සංකල්පණාවෙන් තොරවූ අනුන්ට විනාසයක් නපුරක් වේවයි කල්පණාකිරීම අවිහිංසා සංකල්පණාවෙන් තොරවූ අනුන්ට හිංසා පීඩා කරණ කල්පනාව යනමේ තුන් ආකාරවූ මිථ්‍යාසංකල්පණාවද සම්‍යක්වචනයෙන් තොරවූ මිථ්‍යාවචනයද. හෙවත් බොරුකීම කේලාම්කීම පරුෂවචනකීම සම්ඵප්‍රලාපකීම යන මේ සිව්වැදෑරුම්වූ මිථ්‍යාවචනයද. සම්‍යක්කර්මාන්තයෙන් තොරවූ මිථ්‍යාකර්මාන්තයද හෙවත් සතුන්මැරීම හොරකම්කිරීම පරදාරසෙවනයකිරීම යන මේ තුන්වැදෑරුම්වූ මිථ්‍යාකර්මාන්තයද. සම්‍යක්ආජීවයෙන් තොරවූ අධර්මිෂ්ඨව්‍යාපාරයෙන් ජීවිකාව කිරීමයයි කියනලද මිථ්‍යාආජීවයද. සම්‍යක්ව්‍යායාමයෙන් තොරවූ මිථ්‍යාව්‍යායාමයද. හෙවත් නූපන් අකුසල්උපදවන්ට උපන්අකුසල්

වැඩිදියුණු කරන්නට නූපන් කුසල් නූපදවන්නට උපන් කුසල් විනාශකරන්නට වීර්‍ය නොකිරීමද. සම්‍යක්සිහියෙන් තොරව මිථ්‍යාසිහියද හෙවත් මුළාවීමද. සම්‍යක්සමාධියෙන් තොරව මිථ්‍යාසමාධියද. හෙවත් සමාසාව පිනවීමය යනාදියෙන් පහව සිත එකග නොකිරීමද යන මේ අසවිවජ්ජනධම්මයෝද සියලු පව්නම් වේ. නම් ආදී සියලු පව් තුන් දොරින් නොසිපදවීම සියලු පව් නොකිරීමනම් වන්නේය.—

මෙබව "සබ්බපාපස්ස අකරණං" යන පදයෙන් දළුව දතයුතුයි "කුසලස්ස උපසම්පදා" යනුවෙන් දක්වනලද කුසලයාගේ ඉපදවීම කවරේදයත්! සියලුම කුසලයන්ගේ පහළවීමට නිදාන තුනක් වන්නාහුය එනම් අලොභය කුසල නිදාන නම් වන්නේය අද්වෙෂය කුසලනිදාන නම්වන්නේය අමොහයකුසලනිදාන නම්වන්නේය සිතෙහි යම් අලොභයෙක් වේද එයද කුසල් වන්නේය අලොභයෙන් යුක්තව කයින් වචසින් මනසින් යමක් රැස් කෙරේද එයද කුසල් වන්නේය සිතෙහි යම් අද්වෙෂයෙක් වේද එයද කුසල් වන්නේය අද්වෙෂයෙන් යුක්තව කයින් වචසින් මනසින් යමක් රැස් කෙරේද එයද කුසල් වන්නේය යම්අමොහයෙක් වේද එයද කුසල්වන්නේය අමොහයෙන් යුක්තව කයින් වචසින් මනසින් යමක් රැස් කෙරේද එයද කුසල් වන්නේය මේ සියලු කුසලයන්ගේ පහළ වීමට මුල් හෙතු නිදාන තුනනම් වන්නාහුය. මේ අලොභ අද්වෙෂ අමොහ යන කුසල නිදාන තුනෙන් පහළ වන්නාවූ රාගාදීන්ට ප්‍රතිපක්ෂවූ චෙතනාව කුසලය නම් වන්නේය ඒ කුසලය වනාහි කායසුචරිතය වචීසුචරිතය මනොසුචරිතයයි තුන්වැදෑරුම් වේ ඒහි කායද්වාරයෙහි බහුලව පවත්නාවූ කුසලයතෙම කායසුචරිතයනම්වේ වාග්ද්වාරයෙහි බහුලව පවත්නාවූ කුසලයතෙම වචීසුචරිත නම්වේ මනොද්වාරයෙහි බහුලව පවත්නාවූ කුසලයතෙම මනොසුචරිතනම්වේ මේ ත්‍රිවිධසුචරිතය වනාහි දානමය පුණ්‍යක්‍රියාවස්තුය සීලමය පුණ්‍යක්‍රියාවස්තුය භාවනාමය පුණ්‍යක්‍රියාවස්තුයයි කියා තුන්වැදෑරුම්වේ මේ පුණ්‍යක්‍රියාවස්තු තුන විස්තාරවශයෙන් දසයෙක් වෙත් එනම් දානමය පුණ්‍යක්‍රියාවස්තුවය සීලමය පුණ්‍යක්‍රියාවස්තුවය භාවනාමය පුණ්‍යක්‍රියාවස්තුවය පූජාකිරීම්මය පුණ්‍යක්‍රියාවස්තුවය වතාවත් කිරීම්මය පුණ්‍යක්‍රියාවස්තුවය පින්දීම්මය පුණ්‍යක්‍රියාවස්තුවය පින් අනුමෝදන් වීම්මය පුණ්‍යක්‍රියාවස්තුවය දේසනාමය පුණ්‍යක්‍රියාවස්තුවය ශ්‍රවණමය පුණ්‍යක්‍රියාවස්තුවය දෘෂ්ටිය සෘජුකිරීම්මය පුණ්‍යක්‍රියාවස්තුවය යනමොනුයි.

මෙහි චීවරය පිණ්ඩපාතය සේනාසනය ගිලානප්‍රත්‍යය යනමේ සිව් පසදානයඅතුරෙන්ද රූපාරම්මණදානය ශබ්දාරම්මණදානය ගන්ධාරම්මණදානය රසාරම්මණදානය ස්ප්‍රෂ්ටව්‍යාරම්මණදානය ධම්මාරම්මණදානය යනමේ ආරම්මණදානසයඅතුරෙන්ද ආහාරදානය පානවර්ගදානය ගෘහදානය වස්ත්‍රදානය යාන වාහනදානය මල්දානය විලවුන්දානය සුගන්ධදානය සෙය්‍යාදානය පහන්තෙල්දානය යනමේ දසදානවස්තූන් අතුරෙන්ද යම්ක් යම්ක් දෙන්නාවූ දායකයාහට දීමෙන් පූර්වභාගයෙහිද පරිත්‍යාග කරන කාලයෙහිද පසුව සතුටු සිතින් සිහිකරන කල්හිදැයි මේතුන්කාලයෙහි පැවති චේතනාව දානමයපුණ්‍යක්‍රියාවස්තුවනම්වේ. පන්සිල්දසසිල් සමාදන්වන්නාහටද පැවිදිවන්නෙමියි විහාරයටයන්නාහටද පැවිදිවන්නාහටද මනොරථ සමුදුන්පත්කොට පැවිදිවූයෙමි යහපතැයි ආවර්ජනාකරන්නාහටද ප්‍රාතිමෝක්ෂය රක්ෂාකරන්නාහටද චීවරාදිය නුවණින් ප්‍රත්‍යවේක්ෂා කරන්නාහටද හමුවූ රූපාදීන්හි චක්ෂුරාදීන් සංවරකරන්නාහටද ආජීවය පිරිසිදුකරන්නාහටද පැවැත්තාවූ චේතනාව සීලමය පුණ්‍යක්‍රියාවස්තුවනම්වේ. චක්ෂුආදිඉන්ද්‍රියසයද රූපාදි අරමුණුසයද චක්ෂුවිඥ්ඥාණාදි විඥ්ඥාණසයද චක්ෂුස්පර්ශාදි ස්පර්ශසයද චක්ෂුස්පර්ශයෙන් හටගත් වේදනාවආදි වේදනාසයද රූපසංඥාදි සංඥාසයද ජරාමරණාදෙනද අනිත්‍යවසයෙන් දුක්වසයෙන් අනාත්මවසයෙන් භාවනාකරන්නාහට පැවැත්තාවූ චේතනාවද පඨවිකසිනය ආපොකසිනය තෙජෝකසිනය වායොකසිනය නීලකසිනය පීතකසිනය ලොහිතකසිනය ඔදාතකසිනය ආකාසකසිනය ආලොකකසිනය යනමේ කසිනදසයද උද්ධුමාතකය විනීලකය විපුබ්බකය විච්ඡිද්දකය වික්ඛායිතකය වික්ඛිත්තකය ලොහිතකය පුලවකය අට්ඨිකය යනමේ අසුභදසයද. බුද්ධානුස්මෘතිය ධම්මානුස්මෘතිය සංඝානුස්මෘතිය සීලානුස්මෘතිය ත්‍යාගානුස්මෘතිය දෙවතානුස්මෘතිය උපසමානුස්මෘතිය මරණානුස්මෘතිය කායගතාසතිය ආණාපාණසතිය යනමේ ස්මෘතිදසයද මෛත්‍රිය කරුණාය මුදිතාය උපෙක්ෂාය යනමේ අප්‍රමාණ්‍යය හෙවත් බ්‍රහ්මවිහාර භාවනාසතරද. ආකාසානඤ්චායතනය විඤ්ඤාණඤ්චායතනය අකිඤ්චඤ්ඤායතනය නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යන මේ අරූපභාවනාසතරදැයි කියනලද අටතිස් අරමුණුඅතුරෙන් අර්පණාව නොපැමිණියාවූ සියලු චේතනාද භාවනාමය පුණ්‍යක්‍රියාවස්තූනම්වේ. මහලු තෙරකෙනෙකු දැක වහාහි පෙරගමන්කිරීම පාසිවුරුපිළිගැනීම වැඳීම මාර්ගය ඉඩදීම් ආදිවසයෙන් ආදරසහගතාවූයේ පූජ්‍යාභිරිමය පුණ්‍යක්‍රියාවස්තු

නාම්වේ. වෑඩිතරයන්ට වතාවත් කිරීම් වසයෙන්ද ගමට පිඬුපිණිස පුවෙශවූ භික්ෂූන්දුටු පාත්‍රයගෙන ගමෙහි භික්ෂාව සමාදං කොට එලවීම්වසයෙන්ද යවභික්ෂූන්ගේ පාත්‍රය ගෙනෙතයිව අසා වේග යෙන් ගොස් පාත්‍රා ගෙන ඒම්වසයෙන්ද කායික වතාවත් කිරීම් ස ඞගතවූයේ වතාවත් කිරීම්මය පුන්‍යක්‍රියාවස්තුනම්වේ. දන්දී සුවඳ ආදීන්යන් පූජාකොට අසවලාටනම් මේ පින වේවයි කියාහෝ සියලු සත්වයන්ට පිනවේවයි කියාහෝ පින් දෙන්නාහට පින්දීම්මය පු න්‍යක්‍රියා වස්තුව සිඩවේ. (කිමෙක්ද මෙසේ පින් දෙන්නාහට පින් ක්ෂය වේදයත් ක්ෂයනොවේ යම්සේවනාහි එක්ප්‍රදීපයක් දල්වා එ සින් ප්‍රදීප දහසක් දල්වන්නාහට ප්‍රථම ප්‍රදීපය ක්ෂයවූයේයයි නො කියයුතුයි පලමු ආලොකයසමග පශ්චිමාලොකය එකතුව ඉතා මහත්වේ එපරිද්දෙන්ම පින් දෙන්නාහට පිරිහීමක් නම් නැත් තේය වැඩීමම වේයයි දතයුතුයි) අනුන් විසින් දෙනලද පිනෙහි හෝ අන්‍යවූ පුන්‍යක්‍රියාවෙක හෝ සාධුකියා අනුමොදන් වීම් වස යෙන් පින් අනුමොදනවීම්මය පුන්‍යක්‍රියා වස්තුව දතයුතුයි එක් ධර්මකථිකයෙක් තෙම මෙසේ ධර්මකථිකයෙකැයි මා දනගන්නේයයි ආසාවෙහිසිට ලාභ ගරුකාව බණකියයිද ඒ මහත්ඵල නොවන් නේය එක් ධර්මකථිකයෙක් තමහට පුගුණවූ ධර්මය ලාභයක් ප්‍රාර්ථනා නොකරන්නේ විමුක්ත්‍යායතන ශීර්ෂයෙන්අනුන්ට දෙසනාකෙරෙයිද මේ දෙසනාමය පුන්‍යක්‍රියා වස්තුනම්වේ එකෙක්තෙම මෙසේ මා බණඅසන්නෙකැයි කියාද ඉඩාව ඇත්තෙකැයි කියාද දනගනිත් යයි අසන්නේය ඔහුගේ ඒ බණඇසීම මහත්ඵල නොවන්නේය එ කෙක්තෙම මෙසේ මට මහත්ඵල වන්නේයයි හිතවැඩපැතිරී මෙත් මෘදුසිතින් බණඅසන්නේද ඔහුගේ ඒ බණඇසීම බණඇසීම් මය පුන්‍යක්‍රියාවස්තුනම්වේ. දෘෂ්ටිය ඍජුකරන්නාහට දෘෂ්ටිය ඍජුකිරීම්මයවූ පුන්‍යක්‍රියාවස්තුව සිඩවේ දානමය පුන්‍යක්‍රියාවස්තුව වනාහි දානයක් දෙන්නෙමියි සිතන්නාහටද දානයක් දෙවේලා වෙහි දෙමියිසිතන්නාහටද මාවිසින් දානයක් දෙනලද්දේයයි සිතන් නාහටද උපදී මෙසේ පූර්වචෙතනාවය මුඤ්චනචෙතනාවය අපර චෙතනාවය යන චෙතනාතුනඑකතුව දානමය පුන්‍යක්‍රියාවස්තුව නම්වේ සෙසු පුන්‍යක්‍රියාවස්තූනවයෙහිද මේ ක්‍රමයෙන්ම පූර්වචෙත් නාදීන්ගේ වසයෙන් සීලාදී පුන්‍යක්‍රියාවස්තුවනබව සැලකියයුතු. පින්දීමහා පින්අනුමෝදන්වීම දානමය පුන්‍යක්‍රියා වස්තුවෙහි ඇතු ලත්වේ වතාවත්කිරීමහා පූජාකිරීම සීලමය පුන්‍යක්‍රියා වස්තුවෙහි ඇතුලත්වේ බණකීමහා බණඇසීමද දෘෂ්ටිය ඍජුකිරීමද භාවනා

මය පුණ්‍යක්‍රියාවස්තුවෙහි ඇතුළත්වේ එකල්හි ත්‍රිවිධ පුණ්‍යක්‍රියාවස්තුව වේයයි දතයුතු. තවද සසංස්කාරයකින් පින් රැස්කිරීම වේයයි දක්වනලදී එනම්. “පුඤ්ඤං හි අත්ථි සසංකාරං අත්ථි පරංකාරං අත්ථි සාහත්ථිකං අත්ථි ආණත්තිකං අත්ථි සම්පජානකතං” සසංකාර පිනය පරංකාර පිනය සම්පජාන කෘත පිනය අසම්පජාන කෘත පිනය ආණත්තික පිනය සම්පජනකෘත පිනය යන මේ සය ආකාරයයි. එහි තමන්ගේ ධර්මතාවයෙන් කරනලද පින සසංකාර නම්වේ අනුන් පින් කරන්නා දැක කරනලද පින පරංකාර නම්වේ සියඅතින් කරනලද පින සාහත්ථිකනම්වේ ආඥා කොට කරවනලද පින ආණත්තික නම්වේ කර්මයද ඵලයද අදහා කරනලද පින සම්පජානකෘතනම්වේ කර්මයද ඵලයද නොඅදහා කරනලද පින අසම්පජානකෘත නම්වේයයි මේආදිවසයෙන් දක්වනලද සියලු කුසල්ද සම්‍යක් දෘෂ්ටි ආදි ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයද්‍දයි සනාදි සියලු කාමාවචර රූපාවචර අරූපාවචර යයි යන ලෞකික කුසල්හා සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත්යන සතරමග සතරඵලයද්‍දයි යනමේ ලෝකෝත්තර කුසල්ද රැස්කරගතයුතුයයි වදාළබව සැලකියයුතුයි තවද.——“නවපදානි අකුසලානි. නවපදානි කුසලානි. තත්‍ථ කතමානි නවපදානි අකුසලානි? තණ්හා අවිජ්ජා ලෝභෝ දෝසෝ මෝහෝ සුභසඤ්ඤා සුඛසඤ්ඤා නිච්චසඤ්ඤා අත්තසඤ්ඤාති ඉමානි නවපදානි අකුසලානි යත්‍ථ සබ්බා අකුසලපක්ඛා සඞ්ගහං සමෝසරණං ගච්ඡන්ති. තත්‍ථ කතමානි නවපදානි කුසලානි! සමථෝ විපස්සනා අලෝභෝ අදෝසෝ අමෝහෝ අසුභසඤ්ඤා දුක්ඛසඤ්ඤා අනිච්චසඤ්ඤා අනත්තසඤ්ඤාති ඉමානි නවපදානි කුසලානි යත්‍ථ සබ්බෙ කුසලපක්ඛා සඞ්ගහං සමෝසරණං ගච්ඡන්ති” සියලු අකුසල් ප්‍රකාශවන්නාවූ පදනවයක් හා සියලු කුසල් ප්‍රකාශවන්නාවූ පදනවයක්ද වෙත් එහි අකුසල් ප්‍රකාශවන්නාවූ පදනවයනම් තෘෂ්ණාව අවිද්‍යාව ලෝභය ද්වේෂය මෝහය සුභය යන සංඥාව සැපය යන සංඥාව නිත්‍යය යන සංඥාව ආත්මය යනසංඥාව යන මේ පද නවය අකුසල්නම් වෙත්. කුසල් ප්‍රකාශවන්නාවූ පදනවය කවරේදයත්? සමථය විදර්ශනාය අලෝභය අද්වේෂය අමෝහය අසුභය යන සංඥාව දුකය යන සංඥාව අනිත්‍යය යන සංඥාව අනාත්මය යන සංඥාව යනමේ පදයෝ නවදෙන කුසල් නම් වෙත්. අකුසල් පද නවයෙහි අකුසල පාක්ෂික සියල්ලද කුසල් පදනවයෙහි කුසල පාක්ෂිකසියල්ලද සඞ්ග්‍රහ කිරීමට ඇතුළත්වීමට පැමිණෙන්නේය. මෙසේ මේපද අමලොස සියලුම කුසලාකුසල පාක්ෂික ධර්මයන්ගේ මුල්පදයෝ නම් වෙත්යයි දත ඉතා සියලු අකුසලයන්ට මුල්වන්නාවූ ලෝභය

ද්වේෂය මෝහය යන නිදානතුන අතුරෙන් ලෝභය අසුභ භාවනාවෙන්හා උපෙක්ෂාභාවනාවෙන්ද ද්වේෂය මෛත්‍රීභාවනාවෙන් හා කරුණාභාවනාවෙන්ද මෝහය ප්‍රඥා භාවනාවෙන්හා මුදිතාභාවනාවෙන්ද ප්‍රහීණකිරීමෙන් සියලු පව්නොකිරීම හා සියලු කුසල් වැඩීම දතයුතුයි.

“සචිත්තපරියෝදපනං” යන මෙහි සිත පිරිසිදුකිරීමනම් කවරේදයත්? දුවිධා හි පරියෝදපනා නීවරණප්පහාණාච අනුසය සමුග්ඝාතොච” සිතපිරිසිදුකිරීම වනාහි නීවරණප්‍රහාණය අනුසය සමුග්ඝාතය කියා දෙවැදෑරුම් වන්නාහුය එහි කාමච්ඡන්දනීවරණය ව්‍යාපාදනීවරණය ථිනමිද්ධනීවරණය උද්ධච්චකුක්කුච්චනීවරණය විචිකිච්ඡානීවරණය යනාමේ නීවරණ පස තදඞ්ගප්‍රහාණය විෂ්කම්භනප්‍රහාණය සමුච්ඡේදප්‍රහාණය ප්‍රතිප්‍රස්‍රබ්ධිප්‍රහාණය නිස්සරණප්‍රහාණය යනාමේ පඤ්චප්‍රහාණයන්ගේ වශයෙන් ප්‍රහාණය කිරීම නීවරණප්‍රහාණනම්වේ. කාමරාගානුසය පටිඝානුසය දිට්ඨානුසය විචිකිච්ඡානුසය භවරාගානුසය අවිජ්ජානුසය යනාමේ අනුසයසත මුලින් උදුරානැතිකිරීම අනුසයසමුග්ඝාතනම්වේ. මෙසේ නීවරණ පස පඤ්චප්‍රහාණයන්ගේවශයෙන් ප්‍රහාණයකිරීමහා අනුසයසත මුලින් උපුටා නැසීම සිත පිරිසිදුකිරීමයයි දතයුතු.

“තත්‍ථ යං පටිවෙධෙන පරියොදපෙති ඉදං දුක්ඛං යෙන පරියොදපෙති අයං සමුදයො යෙන පරියොදපෙති අයං මග්ගො යං පරියොදපිතං අයං නිරොධො ඉමානි චත්තාරි සච්චානි” එහි යම්දෙයක් ප්‍රතිවෙධකිරීමෙන් සිත පිරිසිදුකෙරේද මේ ප්‍රතිවෙධකළ දෙය දුඃඛසත්‍යයනම්වේ. යමක්කෙරෙන් සිත පිරිසිදුකෙරේද මේ කීමාවූදෙය සමුදයසත්‍යයනම්වේ යමක්කරන කොටගෙන සිත පිරිසිදුකෙරේද මේ පිරිසිදුකිරීමට කාරණාවූදෙය මාර්ගසත්‍යයනම්වේ යමක් පිරිසිදුකරනලද්දේද මේ පිරිසිදුකරනලද බූදෙය නිරොධසත්‍යයනම්වේ මෙසේ මේ ගාථාවෙහි චතුරාර්‍ය්‍යසත්‍යයසහ “සබ්බපාපස්ස අකරණං” යන්නෙන් අධිසීල ශික්ෂාවද “කුසලස්ස උපසම්පදා” යන්නෙන් අධිචිත්ත ශික්ෂාවද “සචිත්තපරියොදපනං” යන්නෙන් අධිප්‍රඥා ශික්ෂාවද පිරිම කටයුතුයයි ප්‍රකාශ කරනලදී

මෙසේ මේ සියලු පව් නොකිරීමද සියලු කුසල් ඉපදවීමද සිත පිරිසිදු කිරීමද යන මේ සියල්ල සර්වඥ බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ අනුබුද්ධ යන සියලුම බුදුවරයන්ගේ අවවාද අනුශාසනා නම්වේ. තවද පරොපකාර පරාපවාද ඉවසීමය යනාදී අධිවාසන ක්ෂාන්ති තොමෝ සීලාදී ගුණධර්මයන්ට ප්‍රතිපක්ෂවූ අකුසලධර්මයන් තවන හෙයින් මේ ශාසනයෙහි උත්තමවූ තපස්නම්වන්නේය සියලු

බුදුවරයෝ ශාන්තිලක්ෂණවූ නිර්වාණය ශාන්තප්‍රණීතාදි සර්වාකාර
යෙන් උත්තමයයි කියන්නාහුය යමෙක්තෙම අධිවාසනක්ෂාන්තිය
නැති බැවින් අනුන්ගේ දිවිනසාද ඒ අනුන්ගේ දිවිනසනස්වභාව
ඇතිතැනැත්තේ ප්‍රව්‍රජිතයෙක් නොවන්නේය පාණිප්‍රහාරාදියෙන්
අනුන්ට වෙහෙස දෙන තැනැත්තේද ශ්‍රමණ නොවන්නේය. ත
වද පරශ්‍රිදය ශ්‍රේෂ්ඨාර්ථවාචී බැවින් සීලයවනාහි උත්තමාර්ථ
යෙන් පරයයි කියනුලැබේ ඒ ශ්‍රමනතෙමේද අනාවූ යම්කිසි සත්ව
යෙකුට වෙහෙස කරන්නේ සිලය නසන්නෙක්නම්වන්නේය ත
මන්ගේ සීලය විනාස කර නාවූ හෙතෙම ප්‍රව්‍රජිතනම් නොවන්
නේය නොහොත් අධිවාසන ක්ෂාන්තිය නැතිබැවින් අන්සතෙකු
යටත් පිරිසෙයින් ඩැහැ ලේ බොන මදුරුවෙකුපවා ජීවිතයෙන්
තොරනොකෙරේද හෙතෙම පාපමලය දුරුනොකළ බැවින් ප්‍රව්‍රජිතනම්
නොවන්නේය එසේ නොමැරුයේනමුදු දඬුආදියෙන් වෙහෙස
කෙරේද හෙතෙමේද අනුන් වෙහෙසනබැවින් ශ්‍රමණ නම් නො
වන්නේය.— ජිනයාදීන් අනුන්ට ආක්‍රොශාදිවසයෙන් වචනයෙන්
දොෂාරොපණයක්නොකිරීමද පාණිප්‍රහාරාදිවසයෙන් අනුන්ට කි
සිත් උපඝාතයක් මහවත් විනාසයක් අනුපකාරයක් නොකිරීමද
අනුන්ට අනවශ්‍ය විහෙඨනාදිවසයෙන් උපඝාතකිරීම දුරුකටයුතුබැ
වින් සිතිනුත් කිසිවෙක්හට උපඝාතයක් නොකිරීමද ප්‍රාතිමොක්ෂ
සංවරසීලයෙහි රක්ෂාවද ආහාර සෙවීමෙහිද පිළිගැනීමෙහිද වැළ
ඳීමෙහිද අනුන්ටදීමෙහිද පමණ දන්නාබවද නොහොත් දැනැමින්
සෙමින් උපන් සතරපසය පස්විකා වලඳකරනබවද ගම්මදුරුවූ
සෙනස්නෙහි ඇල්මද රූපාරූප අෂ්ට සමාපත්තියෙහිද මාර්ගඵල
විපාකයෙහිද සතතයෙන් යෙදීමද යන මේ සියල්ල සියලු බුදුවර
යන්ගේ අනුශාසනා නම් වන්නේය අවවාද නම් වන්නේයි.
මේ ඔවාදප්‍රාතිමොක්ෂයවනාහි ආනන්දස්ථවිරයන් වහන්සේගේ ප්‍රශ්
නය අරබයා සියලු බුදුවරයන්ගේ පාමොක් උදෙසීම එකාකාරබව
දක්වීමපිණිස බුදුරජාණන් වහන්සේවිසින් වදාරණලද්දේය තවද
මේ ඔවාදප්‍රාතිමොක්ෂය පූර්වේනිවාසානුස්මෘතියටොව අරබයා දීඝස
ඞ්ගියෙහි මහාපදානසූත්‍රයෙහිද බුදුබූදුපටන් අටමසක් පිරුණුතැන
දුරුතුපුරපසලොසවක් පොහෝදවසයි එක්දහස් දෙසිය පණ
සක් රහතුන් වහන්සේගෙන්යුක්තවූ එකමශ්‍රාවකසන්නිපාතය වූ
කල්හි වෙලුවනමහවිහාරයෙහිදී පාමොක් උදෙසීමපිණිසද එතැන්
පටන් ප්‍රථම බොධියයි කියනලද විසිඅවුරුද්ද මුලුල්ලෙහි මසකට
දෙවරක් බැගින් පාමොක් උදෙසීමපිණිසද දෙසනාකාරවදාළසේක
මේ ඔවාද ප්‍රාතිමොක්ෂය බුදුවරයෝම උදෙසන්නාහුය ශ්‍රාවකයින්

වහන්සේලා නොළදෙසන්නාහුය. එසේහෙයින් මේ බුද්ධශාසනයෙහි විසිඅවුරුද්දක්හුගේ ඇවෑමෙන් "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො" යනාදිවශයෙන් ශ්‍රාවකයන් වහන්සේලාවිසින් දෙසනනැපියට "ආණාප්‍රාතිමොක්ෂය අනුද්දනවදළසේක——

තවද. මේ ඔවාදප්‍රාතිමොක්ෂය" ඛුද්දක නිකායාන්තර්ගත "ධම්මපදයෙහි ආ පිළිවෙලට මෙහි අපවිසින් ලියනලද්දේය. "දීඝසඞ්ගි,, "සමන්තපාසාදිකා" "සාරාර්ථදීපනී" ආදියෙහි පළමුවෙනුව ඛන්ති පරමං තපොතිතික්ඛා" යනාදි ගාථාවද. දෙවෙනුව "සබ්බපාපස්ස අකරණං" යනාදි ගාථාවද. තුන්වෙනුව "අනූපවාදො අනූපඝාතො යනාදි ගාථාවද දක්වනලදී. එකී කරුණු අනුසාරයෙන් ඒ එසේම යයි දතයුතුයි.

තවද. කුමක්හෙයින් වනාහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විපස්සී ආදී සත් බුදුවරයන් වහන්සේලාගේම ශාසනයාගේ චිරස්ථිතිකාචිරස්ථිතිකබව වදාළේද බුද්ධවංශ දේශනාවෙහිමෙන් පස්විසි බුදුවරයන්ගේහෝ එසිතුන් වැඩි බුදුවරයනගේහෝ ශාසනයාගේ චිරස්ථිතිකාචිරස්ථිතිකබව නොවදාළේදයත්? යම් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ තොනෙකුගේ ප්‍රතිවෙධ ශාසනය එකාන්තයෙන් නිශ්චයෙන් අදදක්වාන් පවතීද අනුරුදන් නොවීද ඒ බුදුවරයන්මප්‍රකාශකරවදාරමින් විපස්සී ආදී බුදුවරයන්ගේ ශාසනයාගේ චිරස්ථිතිකාචිරස්ථිතිකබව මෙහි වදාළේය ඒ විපස්සී ආදී බුදුවරයන් වහන්සේලාගේ ශ්‍රාවකයෝ එකල්හිද දැන්ද ශුද්ධාවාසභූමියෙහි සිටින්නාහුය පිරිනිවීබැවින් අන්‍ය බුදුවරයන් වහන්සේලාගේ ශ්‍රාවකයෝ නැත්තාහුය. සිද්ධත්ථ තිස්සය ඵුස්සය යන තුන් බුදුවරයන් වහන්සේලාගේ ශ්‍රාවකවරු ශුද්ධාවාසයෙහි උපන්නාහු උත්පත්තියට අනතුරුව මේ ශාසනයෙහි උපකාදීහුමෙන් රහත්බවට පැමිණ නොබෝ කලකින් පිරිනිවියාහුය එහිආයු ඇතිනාක් නොසිටියාහුයයි කියත්" යන මේ අභිප්‍රාව සාරාර්ථදීපනියෙහි දක්වූබැවින් මෙ ඔවාද ප්‍රාතිමොක්ෂ නිදානයෙහිද විපස්සී ආදී සත් බුදුවරයන් වහන්සේලාගේ මාතෘපිතෘ නාමකීර්තනාදිය කර වදාරණලද්දේත් ඒ විපස්සී ආදී සත්බුදුවරයන් වහන්සේලාගේ ශ්‍රාවකයෝ එකල්හිද දැන්ද ශුද්ධාවාසයෙහි සිටින බැවිනැයි සැලකියයුතු—සසර භය දක්නා සියලු දෙනාවිසින්ම මෙහි දක්වනලදද අවවාදනු ශාසනා පිළිපැද සසරදුකින් මිදී අමාමහ නිවන් සම්පත් සිද්ධකරගැනීමපිණිස උත්සාහ කටයුතුයි

නිමි.

## පද්ධිතා

| පිට | පෙල | අසුද්ධ | සුද්ධ |
|---|---|---|---|
| 3 | 15 | පලෙල් | පලොල් |
| 4 | 14 | බ්‍රාම්හණ | බ්‍රාහ්මණ |
| 4 | 24 | ගොත්‍රාද් භූතාඩු | ගොත්‍රාද් භූතවූ |
| 7 | 5 | පොහෝ | පොහොහෝ |
| 7 | 10 | පඬාජීතෙත | පඬාජීතො |
| 5 | 33 | ගනනා | ගන්නා |
| 5 | 18 | මහාශී | මහාශි |
| 7 | 11 | සංවහරෝ | සංවරෝ |
| 1 | 23 | ඛන්තිපරමං | ඛන්තීපරමං |
| 9 | 29 | බාරුකීම | බොරුකීම |
| 12 | 3 | ගෙයනාගිව | ගෙනාවයි |

---

## දැන් වීමයි

මේ "ඕවාදප්‍රාතිමොක්ෂය,, වනාහි සියලු බුද්ධවරයන් වහන්සේලා විසින් අත් නොහැර එකලෙස දෙසනාකර වදාරණලද පරමොත්කෘෂ්ට අවවාද අනුශාසනා ධර්මය නම් වන්නේය. ඒ මේ "ඕවාදප්‍රාතිමොක්ෂය,, ලක්දිව උගතුන් අතරෙහි ප්‍රකටව ආයේ නමුදු මැඩ දෙනා අතරෙහි ප්‍රසිද්ධව නොතිබුනේය. මේ නොබෝද, ලක්දිවට වැඩවදාළ සියම් මහරජ්ජුරුවන් වහන්සේ විසින් රඹුක්කනදී ඕවාදප්‍රාතිමොක්ෂය පිළිබඳ ප්‍රශ්නයක් ඇසූබවත් ඊට පිළිතුරු දුන් හැටිත් සඳරැස පත්‍රයෙහි පළකර තිබුනේය ඒ බව ඒ පත්‍රය බැලූ කාටත් මතක ඇතී. එසින් පසු මේ "ඕවාදප්‍රාතිමොක්ෂය" යන නාමය මුළු ලංකාදිව ප්‍රකටව ගියේයයි කියන්ට කනගාටු නොවෙමු මේ පරමොත්කෘෂ්ට "ඕවාදප්‍රාතිමොක්ෂ" නම් අවවාද අනුශාසනා ධර්මය මුළු ලක්දිව පතුරුවා හරිනු කැමතිඅපවිසින් උගත් සාමින් වහන්සේ කෙනෙකුලවා සකස් කරවාගෙන මුද්‍රනය කරවනලදී.

පොත්ලබාගනුකැමති ගැතුන්විසින්

කොළඹ වේල්ලවීදියේ නො. 140 දරන ඒ. පී. පීරිස් අප්පුහාමි ගෙන්ද.

පානදුරේ සුවරිතොදය අච්චුකන්තාලයෙන්ද

වාද්දුවේ ඩී. බී. ජයතිලක වෛද්‍යාචාර්ය්‍ය තැනගෙන්ද.

මොරණ ඩී. පී. පෙරේරා වෛද්‍යාචාර්ය්‍ය තැනගෙන්ද ඉල්ලනු.


පොත් වෙළෙන්දන්ට පහසු ගනන් වලට දෙනු ලැබේ—

මෙහි අයිතිවාසිකම අපටම තබා ගනිමු

මේවනට. ඩී. බී. ජයතිලක වෛද්‍යාචාර්ය්‍ය තැන සහ

ඩී. පී. පෙරේරා වෛද්‍යාචාර්ය්‍ය යන අපිය.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු